TRANSPARENCY INTERNATIONAL SRI LANKA
Building a Nation of Integrity

**Chairman**
M.D.A. Harold

**Directors**
Dr. P. Saravanamuttu
Tassie Seneviratne
V.K. Nanayakkara
Anushya Coomaraswamy
Nalin Attygalle
Chandra Jayaratne
S.K. Liyanage
Nelum Gamage

**Secretary**
Charuni Gunawardana

2008.12.08

**පුවත් පත් නිවේදනයයි**

එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී ප්‍රඥප්තිය ක්‍රියාවට නැංවීම පිළිබඳව කැබිනට් තීරණයට ප්‍රසාදය පළ කිරීම පිළිබඳව කරුණු කිහිපයක් දැක්වීමට පහත ප්‍රවෘත්ති නිවේදනය නිකුත් කරමි.

එය හැකි ඉක්මනින් පළ කරන්නේ නම් මැනවි.

ස්තුතියි,

ජේ.සී. වැලිඅමුණ,

විධායක අධ්‍යක්ෂ.

---

## දූෂණ විරෝධී නීති ක්‍රියාත්මක කිරීමට රජය ගෙන ඇති තීරණයට ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය ප්‍රසාදය පළ කර සිටී.

එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී දිනය යෙදෙන දෙසැම්බර් 9 ආසන්න වෙත්ම, රජය මීට වසර හතරකට ඉහතදී පිළිගත් එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී ප්‍රඥප්තිය ක්‍රියාවට නැංවීම සඳහා අනපනත් හඳුන්වා දීමට කැබිනට් මණ්ඩලය විසින් ගෙනඇති තීරණයට ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය ප්‍රසාදය පළ කර සිටී.

අල්ලස් කොමිසම, එක්සත් ජාතීන්ගේ සංවර්ධන ව්‍යාපෘතිය, සුපිරිසිදු දැත් සංවිධානය, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය විසින් බොහෝ කාලයක සිට දූෂණ විරෝධී ප්‍රඥප්තිය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පසුබිම සකස් කර ඇති බව ප්‍රකාශ කරන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ විධායක අධ්‍යක්ෂ ජේ.සී.වැලිඅමුණ මහතා තවදුරටත් කියා සිටින්නේ නොයෙකුත් ක්ෂේත්‍රයන් හි බරපතල චෝදනා නැගෙන වකවානුවක ජනතාව බලාපොරොත්තු වන්නේ නීති පක්ෂග්‍රාහී නොවී එඩිතරව ක්‍රියාත්මක කල යුතු බවයි.

රාජ්‍ය පාලනයේ විනිවිදභාවය ඇති කිරීමේ අවශ්‍යතාවය නැවත මතු කරමින් ඒ මහතා යෝජනා කරන්නේ තොරතුරු ලබාගැනීමට ඇති අයිතිය පිළිබඳ පනත, රාජ්‍ය විගණන පනත වැනි නව නීති මගින් විනිවිදභාවය ඇති කිරීමට ක්‍රියාකළ යුතු බවයි.

"එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී ප්‍රඥප්තිය අනුව අල්ලස් කොමිසම වැනි දූෂණ විරෝධී ආයතන ශක්තිමත් කිරීමට මෙන්ම සිවිල් සංවිධාන සමග එක්ව දූෂණ වැලැක්වීමට රජය බැඳී සිටියි. ඒ නිසා සිවිල් සංවිධාන වල ප්‍රබල දයකත්වය ලබා ගෙන දූෂණ මෙරටින් පලවා හැරීමට රජය ක්‍රියා කළ යුතු බව" ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය කියා සිටී.

මෙම වකවානුවේදී දූෂිත ගණුදෙණු හා කටයුතු වලට එරෙහිව ප්‍රහල හඬක් නගන දේශපාලන පක්ෂ, ආයතන සහ පුද්ගලයන් පැසසීමටද අමතක නොකල යුතුය.

# 28/1, Bullers Lane, Colombo 07, Sri Lanka.
Tele : (94) 11 2501474, 2506419 Fax : 94 11 2592287
E-mail : tisl@sltnet.lk Web : http://www.tisrilanka.org